# ඕස්ට්‍රේලියාවේ නර්තනය

මෙරට සිංහල ගුවන්විදුලි වැඩසටහන්වලට නිබඳවම සවන් දෙන අයෙකු වන මා පසුගියදා පැවැති නර්තන සහශ්‍රා ප්‍රසංගය ගැන කළ සාකච්ඡාවේ ගාමිණී රණසිංහ හා කමල් රූපසිංහ දෙපොල විසින් එම ප්‍රසංගය පුහුණු කරන දිනේෂ් ඈපාසිංහ ගැන ගැයූ ප්‍රශස්ති ගායනාවලට සවන් දුන්නේ පුදුමයට පත්වෙමිනි. ගාමිණී වැනි පණ්ඩිතයෙකු මෙවැනි වගකීමෙන් තොර ප්‍රකාශ කිරීම කෙතරම් ඔබ්දැයි ඔබම සලකා බලන්න. මෙය ලිවීමට සිත්වූයේ කිසිවෙකුට පක්ෂව හෝ අපක්ෂව නොව සමාජයේ වගකිවයුතු පුද්ගලයින් අතින් සිදුවන වැරදි පෙන්වාදීමේ යුතුකමක් මටද ඇති බැවිනි.

දිනේෂ් මෙල්බන් නුවර ඉන්නා දක්ෂතම නර්තන ශිල්පියා යැයි ඔවුන් දෙපොලම එකහෙලා කියා සිටියහ. මෙය මෙතෙක් කලක් මෙල්බන් හි නර්තන පාසල් ආරම්භ කර මෙපුර දරුවන්ට නර්තනයේ අතපොත් තබන අනෙකුත් සියලුම නර්තන ගුරුවරුන් හෑල්ලුවට ලක් කිරීමකි. මා දන්නා තරමින් මෙහි සිටින අනෙකුත් නර්තන ගුරුවරුන්ද නර්තනය හොඳින් හැදෑරූ දක්ෂතා ඇති අයයි. මේ අතරින් සමහරුන් නර්තනය පිළිබඳ උපාධි ලැබූ අයයි.

මම ද කුඩා කල ලංකාවේදී නර්තනය හදාරා ඇත්තෙමි. නර්තනය වැනි කලා ක්ෂේත්‍රයන් තුළ නියැලෙන ගුරුවරුන් ඉතා කැපවීමෙන් මෙහි නියැලෙයි. එදා පටන් අද දක්වාම නියම කලාකරුවා දුප්පතෙකු වුවද හදවතින් පොහොසතෙකු බව මා පසක් කර ගත්තේ මා උගත් ගුරුවරුන් ඇසුරිනි. ඔවුන් කාලය හෝ මුදල් ගැන නොසිතා ප්‍රසංග සඳහා දරුවන් පුහුණු කිරීමට කැපවී ක්‍රියා කරයි. විශේෂයෙන්ම ඕස්ට්‍රේලියාව වැනි රටක වෙසෙන අප කාලය හා ධනයෙහි අගය හොඳින් හඳුනමු. මෙසේ කැපවී ක්‍රියාකරන නර්තන ගුරුවරුන් සිටියදී එක් අයෙකු ගැනම වර්ණනා කරමින් අනෙකුන් හෙලා දැමීම ඉතාම පහත් ක්‍රියාවකි.

> _එක් අයෙකු වෙනුවෙන් ප්‍රශස්ති ගායනා කර අනෙක් ගුරුවරුන්ගේ දක්ෂතා හෙලා දැකීම ගඟෙන් දිය බී මුහුදට ආ වඩන්නාක් වැනිය. ඒ මන්ද යත් නර්තනය පිළිබඳ මෙතරම් කතිකාවතක් ඇති වූයේ පෙර මා සඳහන් කළ ගුරුවරුන්ගේ දක්ෂතා හා ඔවුන්ගේ ප්‍රසංග නිසා ය._

පසුගිය කාල වකවානුවේ රංගන - උදුම්බරා විසින් කල රංගාභිෂේක ප්‍රසංගයත්, රශිකා කුලසිංහගේ විශ්ව නර්තන රේඛා ප්‍රසංගයත්, අමා සිරිවර්ධනගේ අමාදහර ප්‍රසංගයත් මෙන්ම දිනේෂ් ඈපාසිංහගේ නර්තන සහශ්‍රා ප්‍රසංගයත්, මම නැරඹුවෙමි. ගාමිණී රණසිංහ ගැයූ තරම් ගත යුත්තක් එහි නොවීය. වෙස් මුහුණක් හරියාකාරව බැඳ ගැනීමටවත් නොදැනීම ගුරුවරයාගේ පාරම්පරික ශිල්පීය ඥාණයේ ලක්ෂණදැයි මම ගාමිණීගෙන් දැනගනු කැමැත්තෙමි. කෙසේ වතුදු මට හැගී යන පරිදි මේ මා ඉහත කී සියලුම ප්‍රසංගවල ඒ ඒ ගුරුවරුන්ට ආවේණික වූ ශිල්පීය ක්‍රම භාවිතා විය. නර්තන ක්‍රම හා වින්‍යාශ භාවිතා විය. එකකට එකක් විවිධ වූ නර්තනයන්ගෙන් මෙම ප්‍රසංග පොහොසත්ව තිබුණි. මේ අනුව මා දකින්නේ මේ සියලුම ගුරුවරුන් තම හැකියාවන්ගෙන් කරට කර සිටින බවයි.

මෙම ප්‍රසංගවලදී මා දුටු අනෙක් කරුණ නම්, දිනේෂ් තම ප්‍රසංගය සඳහා මෙල්බර්න් හි සිටින දරු පරපුරේ වැඩිහිටිම දරුවන් හා (මොවුන් විවිධ ගුරුවරුන් යටතේ කලක සිට ඉගෙනුම ලබා දක්ෂතා වර්ධනය කරගත් අය මෙන්ම කලක සිටම තමන් විසින් තනාගත් විවිධ කණ්ඩායම්වල රැගුම් දක්වමින් සිටි අයයි) ලංකාවේ නැටුම් හදාරා මෙහි විශ්වවිද්‍යාලවල උපාධි ලබා ගැනීමට පැමිණි අය සම්බන්ධ කර ගනිමින් ඉතා කෙටි කලකින් තම ප්‍රසංගය පුහුණු කර ගැනීමත්, අනෙක් ගුරුවරුන් ළමුන්ට මුලසිටම උගන්වා බොහෝ වෙහෙස වී බොහෝ කාලයක් පුහුණු කර ප්‍රසංගවලට ඉදිරිපත් කිරීමත්ය. මෙයින් වඩාත් වටිනා සේවාව කරන්නේ කවුරුන්ද? ගාමිණී හා කමල් මදක් ඇස් ඇර බලන්න ඔබ කරන්නේ කොතරම් අමනෝඥ ක්‍රියාවක්ද? පනින්න පෙර සිතා බලන්න යැයි කීවේ කට කසනවාටද? බෙරික් විහාරයට ආධාර පිණිස මෙය කිරීම පුණ්‍ය ක්‍රියාවකි. කමල් ඔබ මෙවන් කටයුත්තකට සම්බන්ධවීම ගැන එක් ගුවන්විදුලි නාලිකාවකින් දිනේෂ්ට ස්තුතිවන්න විය. ඔබ අනෙක් ගුරුවරුන්ගෙන් ඇසුවා නම් ඔවුන්ද එවන් කටයුත්තකට නොඅනුමානවම සහය දෙන බව මට ඒකාන්ත කොට කිව හැක.

මා සිතන පරිදි පොදුවේ මෙහි සිටින සියලුම නර්තන ගුරුවරුන් එකිනෙකාට නොපරදින දක්ෂතා ඇති අයයි. මෙය මෙල්බන් අප කාගේත් වාසනාවකි. එබාවින් එක් අයෙකු වෙනුවෙන් ප්‍රශස්ති ගායනා කර අනෙක් ගුරුවරුන්ගේ දක්ෂතා හෙලා දැකීම ගඟෙන් දිය බී මුහුදට ආ වඩන්නාක් වැනිය. ඒ මන්ද යත් නර්තනය පිළිබඳ මෙතරම් කතිකාවතක් ඇති වූයේ පෙර මා සඳහන් කළ ගුරුවරුන්ගේ දක්ෂතා හා ඔවුන්ගේ ප්‍රසංග නිසාම බව සිහි කලයුතු නිසාය.

**සංගීත් දහනායක**

මෙල්බන්

සූරිය
SOORIYA
**ශ්‍රී ලාංකික ඔබේ වෙළඳසල**
**22 Lorne Street Lalor Vic 3075**
**Tel 03 9402 5380 Melway 9B6**

# ජපන් රස කතා

## තේ කෝප්පය සහ සිත



නන් ඉන් යනු (1868-1912) මෙයිජි යුගයේ ජීවත් වු සෙන් ආගමික ගුරුවරයෙකි. වරක් විශ්ව විද්‍යාල මහාචාර්ය වරයෙකු සෙන් දහම පිළිබඳව සාකච්ඡා කිරීමට කැමති බව පවසා එතුමා මුණ ගැසීමට අවස්ථාවක් සලසා දෙන මෙන් ඉල්ලා සිටියෙන් පැමිණීමට අවසර ලැබිණි.

මහාචාර්යවරයා පැමිණි විට නන් ඉන් ඔහුව පිළිගෙන තේ පිළිගැන්වීමට සැරසුණි. පළමු කොට අමුත්තාගේ කෝප්පයට තේ වත්කර එය නොනවත්වාම කරගෙන ගියේය. තේ බඳුන උතුරා යන තෙක් බලා සිටි මහාචාර්ය වරයා තව දුරටත් බලා සිටිය නොහැකිව මෙසේ කීවේය.

කෝප්පය උතුරලා යනවා. ඔයිට වැඩිය එකට තේ දමන්නට බැහැ.

නන් ඉන් මෙසේ පිළිතුරු දුනි.

මේ තේ කෝප්පය වගේම ඔබත් ඔබේ අදහස් හා අනුමාන වලින් පිරිලා. ඔබ පළමු කොට ඔබේ කෝප්පය හිස් කරන තෙක් මම කොහොමද ඔබට සෙන් ආගම වටහා දෙන්නේ?

සෙන් කතා

**ශ්‍රියා කුමාරසිංහ**

# සුරක්නා 2007
Surakna



**Australia Sri Lanka Carers Association Inc.**
**proudly presents**
Surakna 2007

cultural concert, bridal show &, dinner dance,and music by B-SHARP

Saturday 15 th September
6.30 pm onwards
Arthur Wren Community Hall
Stuart Avenue, Hampton Park
Mel: 96 F 8

for more information
Shiroma: 8790 2158
Roshani: 9793 9017
Kamani: 9702 5828

## VASS (Victorian Association of Sri Lankan Singers)
# මාධ්‍ය සම්මාන පුදයි

VASS-Victorian Association of Sri Lankan Singers, එහෙම නැත්නම් වික්ටෝරියාවේ ශ්‍රී ලාංකික ගායන ශිල්පී සංගමය, ඉතාමත් අළුත් සංගමයක්. සංගමය අළුත් වුවත්, එහි සාමාජික සාමාජිකාවන් වසර ගණනාවක් පුරා ගීත ගායනයේ යෙදී සිටින අය බව, ඔබ කවුරුත් නොදන්නා කාරණාවක් නොවෙයි. 1970 දශකයේ මැද භාගයේ සිට මෙරටට සංක්‍රමණය වුණු අප කිහිප දෙනෙක්, 1980 දශකයේ මුල් අවධියේ සිට මෙල්බන් පුරවරයේදී ගීත ගායනය ආරම්භ කලා. අපගේ වාසනාවකට, අපගේ ගීත ප්‍රචාරය කිරීමට ප්‍රයෝජනවත් මාධ්‍යය වන මෙල්බන් ශ්‍රී ලාංකික ගුවන් විදූලියේ ආරම්භයද මෙම කාලයේදීම සිදූ වූ බව කීවොත්, මා නිවැරදි යැයි හිතනවා.

එවකට ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් විකාශනය කෙරුණු, ""3EA" නමින් හැඳින්වූ පැය භාගයේ ශ්‍රී ලාංකික ගුවන් විදූලි වැඩ සටහනේ විනාඩි 10 ක් සිංහලෙන් වැඩ සටහන් ප්‍රචාරය කිරීම, එදා කරූ ලියනාරච්චි අතින් ආරම්භ වුනා. වැඩි කලක් නොගොස්, මෙම පැය භාගයේ වැඩ සටහන තනිකරම සිංහලෙන් ප්‍රචාරය කිරීමට කරූ සමත් වුනා. 3EA වෙතින් SBS වෙත ගිය කරූ, කලක් තිස්සේ රමණී සමඟ එම වැඩ සටහන ගෙන යමින් අපට දූන් සහය, මා ඉතාමත් අගය කොට සලකනවා. මේ අවස්ථාවේදී මම, රමණී ලියනාරච්චිවත්, ඉතාමත් ගෞරව පූර්වකව සිහිපත් කරනවා. SBS රේඩියෝවේ, සිඩ්නි සහ මෙල්බන් නගර දෙකින්ම අපට ලැබෙන සහයෝගය, අපි ආදරයෙන් සිහිපත් කරනවා. 1980 දශකයේ, ඔල්ගා මෙන්ඩිස්, බන්දූ දිසානායක, උපා උපදාස, දයා දයානන්ද, නිමල් ජයලත්, සරත් විතානච්චි යන අයගේ ඇප කැප වීමෙන්, 3ZZZ සිංහල ගුවන් විදූලි වැඩ සටහන ඇරඹුණා. පැයක කාල සීමාවකින් ආරම්භ කෙරුණු 3ZZZ වැඩ සටහනේ, දහසකුත් දේ ප්‍රචාරය කරණ අතරතුර, මෙල්බන් ගායක ගායිකාවන්ගේ ගීතත් ඉඳහිට හෝ ප්‍රචාරය කිරීමෙන් දූන් සහය, අප ඉතා අගය කොට සලකනවා. ඒ වගේම, රන්ජිත් සහ රූබි වික්‍රමසිංහ විසින් "3SER", ගාමිණී ෆොන්සේකා විසින් ලක් හඬ, නිමල් අබේසේකර විසින් පවන, සාලිය ගලප්පත්ති විසින් ලක් මිහිර, රවී කරවිදෙනිය විසින් ස්වර්ණ FM" සහ ජගත් ජේ. එදිරිසිංහ, ශ්‍රීනාත් මද්දූමගේ සහ දසුන් ගජමන් විසින් තිසර FM, යන ගුවන් විදූලි වැඩ සටහන්ද ආරම්භ කෙරුණා.

ඒ සියළුම සිංහල ගුවන් විදූලි මාධ්‍ය වෙතින් අප හට මෙතෙක් කල් ලැබුණු සහයෝගය, මා මෙහිදී කෘතඥතා පූර්වකව සිහිපත් කරනවා.
ගුවන් විදූලි මාධ්‍ය මෙන්ම, පුවත් පත් මාධ්‍යද අපට අමතක කළ නොහැකියි. මුලින්ම, 1989 දී, "The Sri Lankan" නමින් මාසික පුවත් පතක්, රොඩ්නි අරඹෙවෙල, කරූ ලියනාරච්චි සහ H.L.D. මහින්දපාල යන අය විසින් දියත් කෙරුණා. ඉන්පසු, විරෝශ සහ ගීතිකා පෙරේරා විසින් "Serendib News" සහ ආයුබෝවන් පුවත් පත්ද, වරුණ සාවින්ද සහ ජගත් ජේ. එදිරිසිංහ විසින් පහණ පුවත් පතත්, ජගත් ජේ. එදිරිසිංහගේ සංස්කරණයෙන් සන්නස පුවත් පතත් ඇරඹුණා. විටින් විට මෙම පුවත් පත් වලින් පුද්ගලික මට්ටමෙන් හෝ, මෙල්බන් ගායන ශිල්පීන් සහ ඔවුන්ගේ නිර්මාණ ගැන සඳහන් ලිපි සහ ඡායාරූප ආදිය පළ කිරීමෙනුත්, ඔවුන්ගේ ගීත ප්‍රසංග සඳහා ප්‍රචාරයක් ලබා දීමෙනුත් ලබා දූන් සහයද, අපි ඉතා අගය කොට සලකනවා. 1990 දශකයේ මුල් භාගයේදී, සිංහල රූපවාහිණී වැඩ සටහන් මුලින්ම මෙල්බන් පුරවරයේ දියත් කෙරුණා. ආරම්භකව, සිංහල සංස්කෘතික පදනමේ මූලිකත්වයෙන් තිලක් විජේවර්ධන විසින් සම්බන්ධීකරණය කොට, නිමල් අල්විස්ගේ තාක්ෂණික දායමත්වයෙන් ඉදිරිපත් කරණ ලද "TV Sri Lanka" රූපවාහිණී වැඩ සටහනත්, ඉන්පසු නිමල් අල්විස් විසින්, 2004 දී ආරම්භ කරණ ලද ූරඉ ළඅනකඅ ගඹරනඉනග ූහඹත සහ මෑතකදී දියත් කරණ ලද නන්දන වින්දන රූපවාහිණී වැඩ සටහනුත්, මට මෙහිදී සිහිපත් කළ හැකියි. මෙම රූපවාහිණී වැඩ සටහන් වලිනුත්, අපගේ මෙපුර ගායන ශිල්පීන්ගේ ගීත වල වීඩියෝ දර්ශන පට විකාශනය කිරීමෙන් දෙනු ලබන සහයෝගය, අප ඉතා අගය කොට සලකනවා.

පරිගණක තාක්ෂණයේ වර්ධනයත් සමගම බිහි වූ නවතම මාධ්‍යයක් තමයි, වෙබ් අඩවි. මුලින්ම, හේමාල් ගුරුසිංහ විසින් ඇරඹූ "www.srilankaevents.com" වෙබ් අඩවියෙනුත්, ඉන්පසු උදය ගෝවින්න විසින් ඇරඹූ www.thummansala.com වෙබ් අඩවියෙනුත්, අපගේ ගායන ශිල්පීන් සහ ඔවුන්ගේ ගී නිර්මාණ සහ ගී ප්‍රසංග ප්‍රචාරය කිරීමෙහිලා ලැබුණු සහයෝගයත්, අපගේ සතුටට කාරණයක්.

1980 දශකයේ සිට අවුරුදූ 25 ක් තුළ, අපට මේ සියළුම මාධ්‍ය වලින් ලැබුණු ඒ නොමඳ සහය අගය කිරීමේ චේතනාවෙන් මෙවැනි කෘතගුණ සැලකීමක් කිරීම, අපගෙන් ඉටු විය යුතු යුතුකමකි.

දයා සිල්වා - සභාපති VASS





VASS (Victorian Association of Sri Lankan Singers) නමින් හඳුන්වන, වික්ටෝරියාවේ ශ්‍රී ලාංකික ගායන ශිල්පී සංගමය විසින්, ජුනි මස 3 වෙනිදා බ්‍රෝඩ්මෙඩෝස්හි හියුම් සිටි සෙන්ටර්හිදී, පෙර නොවූ විරූ ජන මාධ්‍ය උපහාර උලෙළක් පවත්වන ලදී. අපගේ මෙල්බන් ගායන ශිල්පීන් සහ ඔවුන්ගේ ගී නිර්මාණ සහ ගී ප්‍රසංග ප්‍රචාරය කිරීමෙහිලා මෙරට ශ්‍රී ලාංකික මාධ්‍ය වෙතින් මෙතෙක් කල් ලැබුණු සහයෝගය අගය කිරීමේ අරමුණින්, මෙම උත්සවය සංවිධානය කොට තිබිණ. මෙල්බන් ශ්‍රී ලාංකික මාධ්‍ය ඉතිහාසයේ එතෙක් මෙතෙක් ඇප කැප වී කටයුතු කරණ ලද සියළු දෙනාම මෙහිදී ගෞරවයෙන් සිහිපත් කරණ ලද අතර, දැනට ක්‍රියාත්මක මාධ්‍ය ආයතන සියල්ලට මෙන්ම මෙම වැඩ සටහන් පුරෝගාමීව දියත් කිරීමට උරදූන් අයටද උපහාර සමරූ පලක පිරිනමණ ලදී. VASS සංගමයේ සභාපති දයා සිල්වා සභාව අමතමින් මෙපුර ශ්‍රී ලාංකික මාධ්‍ය වල ඉතිහාසය මැනවින් සිහිපත් කර දීමෙන් අනතුරුව එම සමරූ පලකයන් පිරිනමණ ලද්දේ, වික්ටෝරියාවේ ශ්‍රී ලාංකික කොන්සල් ආචාර්ය රොඩ්නි අරඹෙවෙල අතිනි.